# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்லை.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } 3/1/6 | ඔබේ අංකය / உமது இல / Your No } | දිනය / திகதி / Date } 2020.05. 20 |

චක්‍රලේඛ අංක : **2020/06**

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,
සියලුම ඉඩම් කොමසාරිස්වරුන්/ සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)

**දීර්ඝකාලීන බදු පදනම මත රජයේ ඉඩම් ලබාගෙන ඇති බදුකරුවන් සඳහා සහන ලබාදීම**

රජයේ ඉඩම් කළමණාකරණය කිරීමේ කඩිනම් වැඩසටහන යටතේ බදු ආදායම් නියමිත පරිදි ගෙවූ බදු ගැනුම්කරුවන් අපහසුතාවයට පත් කිරීමෙන් තොරව, රාජ්‍ය ආයතන විසින් බදු පදනම මත බැහැර කර ඇති ඉඩම්වල බදු කුලිය එකතු කිරීම සඳහා සරල හා පහසු ක්‍රමවේදයක් ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අමප/20/0374/228/005 හා 2020.02.27 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව පහත තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම මෙම චක්‍රලේඛය නිකුත් කිරීමේ අරමුණ වේ.

**01.** බදු මුදල් ගෙවීම සඳහා බදුකරුවන් දිරිමත් කිරීම.

**1.1** කාර්තුමය පදනමින් බදු මුදල් ගෙවීමට අවස්ථාව සලසා දීම.

දීර්ඝකාලීන බදු පදනම මත බැහැර කර ඇති වාණිජ, කෘෂිකාර්මික, නේවාසික ඉඩම් සඳහා වාර්ෂික පදනමින් බදු අය කිරීම සාමාන්‍ය ප්‍රතිපත්තිය වේ. මෙම වාර්ෂික බදු මුදල එකවර අය කිරීම මත වාණිජ හා කෘෂිකාර්මික කටයුතුවල නිරත වගාකරුවන්, ආයෝජකයන්, ව්‍යාපාරිකයන්, නේවාසික ඉඩම් භුක්ති විඳින නේවාසිකයන්, රජයේ නිලධාරීන්, වෘත්තිකයන් මෙන්ම සමස්ත ප්‍රජාවම අපහසුතාවයට පත්වීම මත බදු ගෙවීම පැහැර හරින අවස්ථා වර්ධනය වී ඇති අතර ඒ තුළින් රජයේ බදු ආදායම එකතු වීමද අඩු වී ඇත. එබැවින් වාර්ෂික බදු මුදල කාර්තුමය පදනමින් අය කිරීමට උක්ත අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව බදුකරුවන් මේ පිළිබඳව දැනුවත්කර කාර්තුමය පදනමින් බදු ගෙවීමට එකඟවන බදුකරුවන්ගේ වාර්ෂික බදු මුදලෙන් කාර්තුවකට අදාළ මුදල නියමිත පරිදි අය කිරීමට කටයුතු කරන්න. බදු අය කිරීම අදාල පරිදි ගිණුම්ගත කිරීමටත්, බදු ලෙජරයෙහි සටහන් යොදා ක්‍රමවත්ව පවත්වාගෙන යාමටත් කටයුතු කළ යුතු අතර එක් එක් බදුකරුගේ බදු වර්ෂය ආරම්භ වන දිනයේ සිට කාර්තුමය පදනමින් බදු අය කිරීම ආරම්භ කළ යුතුය. එක් එක් කාර්තුවේ දී ගෙවිය යුතු බදු මුදල ගෙවීම පැහැර හරින්නේ නම් කාර්තුවකට ගෙවිය යුතු බදු මුදල සඳහා 10%ක පොලියක් අය කළ යුතුය. කාර්තුමය පදනමින් බදු ගෙවීම සඳහා බදුකරුවන්ගෙන් ඉල්ලීමක් ලද පසු එක් කාර්තුවක් සඳහා බදු ගෙවිය යුතු දිනය හා ගෙවිය යුතු මුදල ඇමුණුම 01 හි පරිදි නිවැරදිව බදුකරු වෙත ලිඛිතව දැන්වීමට කටයුතු කරන්න.


| | | | | |
|---|---|---|---|---|
| ආයතන / நிர்வாகம் / Admin ☎ 011 279 7479 🖷 011 287 3033 | ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 🖷 011 286 4462 | ඉඩම් I / காணி I / Land I ☎ 011 287 4025 🖷 011 288 3812 | ඉඩම් II / காணி II / Land II ☎ 011 287 5834 🖷 011 287 3110 | ඉඩම් III / காணி III / Land III ☎ 011 279 7482 🖷 011 288 3635 |

**1.2 දිරිගැන්වීමේ වට්ටම් ක්‍රමයක් හඳුන්වා දීම.**

නියමිත පරිදි අඛණ්ඩව බදු ගෙවන බදුකරුවන් දිරිමත් කිරීම සඳහාත්, බදු ගෙවීම ප්‍රවර්ධනය කිරීම සඳහාත් බදුකරුවන් වෙත දිරිගැන්වීමේ වට්ටමක් ලබාදීමට තීරණය වී ඇත. බදුකරුවන් බදු කාල සීමාවේ මුල් මාසයේ අවසන් දිනට පෙර ගෙවිය යුතු සම්පූර්ණ වාර්ෂික බදු මුදල ගෙවා අවසන් කරන්නේ නම් එම බදු මුදලෙන් 10%ක වට්ටමක් ලබාදීමට කටයුතු කරන්න. එසේ ලබා දෙන බදු වට්ටම බදු වට්ටම් පාලන ගිණුමට හර කළ යුතු අතර දීර්ඝකාලීන බදු සඳහා වූ පාලන ගිණුමට බැර කළ යුතුය. මෙම වට්ටම නේවාසික, කෘෂිකාර්මික, වාණිජ කටයුතු සඳහා දීර්ඝකාලීන බදුකර නිකුත් කර ඇති හා බදු අනුමැතිය සහිත අවස්ථා සම්බන්ධයෙන් අදාළ වේ. ඒ පිළිබඳව සියළුම බදුකරුවන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා මෙහි ඇමුණුම 02 ආකෘතිය භාවිතා කරන්න.

**2. හිඟ බදු අය කිරීම ප්‍රවර්ධනය කිරීම.**

**2.1 දඩ පොලිය සඳහා සහන ලබාදීම.**

හිඟ බදු මුදල මත අය කරන දඩ පොලිය හේතුකොට ගෙන ගෙවිය යුතු බදු මුදල ඉහළ යාම මත හිඟ බදු ගෙවීම සඳහා බදුකරුවන් අධෛර්යමත් වී ඇති අතර එමගින් හිඟ බදු අය කිරීම මන්දගාමී වී ඇති බව නිරීක්ෂණය වේ. එබැවින් 2019.12.31 දිනට පවතින හිඟ බදු සඳහා වූ දඩ පොලිය අය නොකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත.

ඒ අනුව යම්කිසි බදුකරුවෙකුගෙන් අය කළ යුතු හිඟ බදු මුදල අය කිරීමේදී 2019.12.31 දින දක්වා හිඟ බදු මුදල මත අය කළ යුතු 10%ක් වූ දඩ පොලිය අය නොකිරීමට කටයුතු කරන්න. මෙම දඩ පොලී අය නොකිරීමේ සහනය හිමිවන්නේ 2019.12.31 දිනට හිඟ බදු මුදල් සඳහා ගෙවිය යුතු දඩ පොලිය සඳහා පමණි. 2019.12.31 දිනට හිඟ බදු මත ගෙවිය යුතු දඩ පොලිය කපා හැරීමේ කටයුතු 2021.12.31 දින වන විට සිදුකර අවසන් කළ යුතුය. 2020.01.01 දින සිට සියලුම හිඟ බදු සඳහා 10%ක දඩ පොලිය අය කිරීම අඛණ්ඩව සිදුකළ යුතු බව අවධාරණය කරමි. ඒ අනුව ඒ පිළිබඳව මෙහි ඇමුණුම 03 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව බදුකරුවන් දැනුවත්කර හිඟ බදු වාරික මුදල් අය කිරීම ප්‍රවර්ධනය කරන්න. මේ පිළිබඳ මෙම චක්‍රලේඛයේ 05 කොටසෙහි සඳහන් ආකාරයට දත්ත පද්ධතියක් පවත්වාගෙන යාවත්කාලීන කරන්න. දැනටමත් යම්කිසි බදුකරුවෙකුගෙන් නියමිත පරිදි 10%ක දඩ පොලිය අයකර ඇති අවස්ථාවකදී එසේ අය කරන ලද දඩ පොලිය ආපසු බදුකරු වෙත ගෙවීමට හැකියාවක් නොමැති බැවින් එවැනි ඉල්ලීමක් ලදහොත් ඒ පිළිබඳව බදුකරුවන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

**2.2 හිඟ බදු ගෙවීම සඳහා සහන කාලයක් ලබාදීම.**

හිඟ බදු ගෙවීම සඳහා බදුකරුවන් වෙත එක් වර්ෂයක සහන කාලයක් ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව උපරිම වසරක කාලයක් තුළ හිඟව ඇති බදු මුදල එක්වර හෝ කොටස් වශයෙන් ගෙවීමට බදුකරුවන් වෙත අවස්ථාව සලසා දෙන්න. බදුකරුවන් දැනුවත් කිරීමට කටයුතුකර වාරික වශයෙන් ගෙවීමට බදුකරු එකඟ වන ආකාරය මෙහි ඇමුණුම 04 ආකෘතිය අනුව බදුකරුගේ ඉල්ලීමක ආකාරයෙන් ලබා ගැනීමට කටයුතු කරන්න.

උක්ත අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි හිඟ බදු ගෙවීම සඳහා උපරිම වසරක සහන කාලයක් ලබාදිය හැකි බැවින් උපරිම වසරක් දක්වා වූ සහන කාලයක් සඳහා අනුමැතිය ලබාදීම ප්‍රාදේශීය ලේකම් වෙත පවරමි. ඉන් පරිබාහිරව වූ සහන කාලයක් සඳහා ඉල්ලීමක් ඉදිරිපත් වූ විට මෙහි ඇමුණුම 05 ආකෘතිය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය, ඉදිරි කටයුතු පිළිබඳ සලකා බැලීම සඳහා මා වෙත එවන්න. හිඟ බදු ගෙවීම සඳහා ලබාදුන් සහන කාලය අනුව එක් වාරිකයක් ගෙවීමෙන් පසු බදුකරය සැකසීම කළයුතු බැවින්, බදු ගෙවූ රිසිට්පත්වල පිටපත් හා බදු ලෙජරයේ පිටපතක් මා වෙත එවන්න.

**3. වාණිජ හා කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු ලබා දී ඇති බදුකරුවන් වෙත සහන ලබාදීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ පූර්ව 2017.03.22 දිනැති අමප/17/0390/738/005 හා 2018/02/28 දිනැති අමප/18/0293/738/002 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතීන් මගින් වාණිජ හා කෘෂිකාර්මික කටයුතු සඳහා බදු සහන ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද දිනට පෙර, එනම් වාණිජ කටයුතු සඳහා 2017.03.22 දිනට පෙර සහ කෘෂිකාර්මික කටයුතු සඳහා 2018.02.28 දිනට පෙර දීර්ඝකාලීන බදු ලබාදීමට තෝරාගෙන ඇති හෝ ගරු ඇමතිතුමා වෙතින් බදු අනුමැතිය ලැබී ඇති හෝ දීර්ඝකාලීන බදුකර නිකුත් කර ඇති බදුකරුවන්ට එම අමාත්‍ය මණ්ඩල අනුමැතීන් මගින් බදු ප්‍රතිශෝධන සහනය හිමි නොවූ බැවින් එම බදු ප්‍රතිශෝධන සහන ඉල්ලීම් සලකා බලා එම බදුකරුවන්ට ද, බදු ප්‍රතිශෝධන සහනය ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත.

ඒ අනුව, වාණිජ හා කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු ලබා දී ඇති බදුකරුවන් අතරින්, වාණිජ කටයුතු සඳහා නම් 2017.03.22 හා කෘෂිකාර්මික කටයුතු සඳහා නම් 2018.02.28 දිනට ප්‍රථම බදු ප්‍රතිශෝධන ආරම්භ වී 50%කින් බදු ප්‍රතිශෝධනය කර ඇති 2017/01 සහ 2018/02 චක්‍රලේඛ මත මේ වන තෙක් බදු ප්‍රතිශෝධන සහනය හිමි නොවූ බදුකරුවන් වෙත 2020.01.01 දින සිට අදාල වන පරිදි 20% බදු ප්‍රතිශෝධන සහනය ලබාදීමට මෙමගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2020.01.01 දිනට පසුව එළඹෙන බදු වාරිකයේ දී වාර්ෂික බදු මුදල ගණනය කිරීමේදී, ආසන්නතම බදු ප්‍රතිශෝධනය සිදු කරන ලද වර්ෂයට පූර්ව වර්ෂයේ අය කළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතුකර ගණනය කරන්න. එසේ ගණනය කළ පසු 2020 වර්ෂයට අදාල දීර්ඝකාලීන බදු ඇස්තමේන්තුව ද ඒ අනුව සංශෝධනය කරන්න. 2020.01.01 දින සිට මෙම චක්‍රලේඛය නිකුත් කරන දින දක්වා 2020 වර්ෂයට අදාළ බදු වාරිකය 50% ප්‍රතිශෝධනය යටතේ දැනටමත් අයකර ගෙන තිබෙනම්, එසේ වැඩිපුර අයකර ගෙන ඇති බදු මුදල ඉදිරි බදු වාරිකයේදී හිලව් කිරීමට කටයුතු කරන්න.

2020.01.01 දින සිට ලබා දෙන මෙම බදු සහනය, වසර 05 කට වරක් එළඹෙන බදු ප්‍රතිශෝධනයක් සේ නොසැලකිය යුතුය. මෙය බදු සහනයක් මිස, තවත් බදු ප්‍රතිශෝධනයක් නොවන බව අවධාරණය කරමි. බද්ද ආරම්භ වන දිනයේ සිට සාමාන්‍ය පරිදි වසර 05කට වරක් බදු ප්‍රතිශෝධනය කළ යුතුය. ඒ අනුව සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ඊළඟට එළඹෙන බදු ප්‍රතිශෝධනයේදී එයට පූර්ව වර්ෂයේ අය කළ බදු මුදලට 20%ක් එකතු කර වාර්ෂික බදු මුදල ගණනය කරන්න. බදු අනුමැතියක් පමණක් පවතින අවස්ථාවල මේ සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අදාළ නොවන අතර මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිදි ගෙවිය යුතු බදු මුදල ගණනයකර මෙහි ඇමුණුම 06 ආකෘතිය ප්‍රකාරව බදුකරුවන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

දැනටමත් බදුකරයක් නිකුත් කර පවත්වාගෙන යන අවස්ථාවලදී බදුකරයේ බදු ප්‍රතිශෝධනය සඳහා වන කොන්දේසිය සංශෝධනය කළ යුතු බැවින් මෙහි ඇමුණුම 06 ආකෘතිය ප්‍රකාරව ඔබගේ නිර්දේශය මේ සමඟ අමුණා ඇති ඇමුණුම 07 ලේඛනය පිටපත් 3කින් සම්පූර්ණ කර බදුකරුගේ අත්සන සහිතව යොමුගත ලිපියේ පිටපතක් පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්ට යොමුකර මා වෙත එවන්න. ඇමුණුම 07 ලේඛනය පෘෂ්ඨාංකනය කර මාගේ අනුමැතිය සහිතව ඔබ වෙත එවනු ඇත. පෘෂ්ඨාංකනය කරන ලද ඇමුණුම 07 හි පිටපත් 3, ලියාපදිංචි කරන ලද මුල් බදුකරයේ සහතික පිටපතක් සහිතව ලියාපදිංචිය සඳහා යොමු කරන්න. ලියාපදිංචි කර ඔබ වෙත ලැබෙන එක් පිටපතක් බදුකරු වෙත භාර දී අනෙක් පිටපත බදුකරයේ කාර්යාල පිටපත සමඟ ගොනුකර තබන්න.

ඒ අනුව මාගේ 2017/01 හා 2018/02 චක්‍රලේඛ අදාළ පරිදි සංශෝධනය වූ සේ සලකන්න. එම චක්‍රලේඛයන්හි පවතින අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

**4. නේවාසික කටයුතු සඳහා බැහැර කර ඇති හා ඉදිරියේ දී බැහැර කිරීමට නියමිත ඉඩම් සඳහා බදු සහන ලබාදීම.**

මේ සම්බන්ධයෙන් වූ මාගේ 2015/1, 2015/1(1), 2015/1 (11) චක්‍රලේඛ හා එම චක්‍රලේඛ ඒකාබද්ධ කරමින් නිකුත් කළ 2020/5 චක්‍රලේඛය හා බැඳේ. ඒ අනුව එම චක්‍රලේඛය මගින් නාගරික හා වැඩිදියුණු කළ ප්‍රදේශවල ජනතාවට පමණක් නේවාසික කටයුතු සඳහා බදු සහන ලබාදීම මගින් ග්‍රාමීය ප්‍රදේශවල ද දීර්ඝකාලීන බදු පදනම මත නේවාසික ඉඩම් භුක්ති විඳින ප්‍රජාවට එම සහනය අහිමි වී ඇත. ඒ පිළිබඳ සලකා බලා ග්‍රාමීය ප්‍රදේශවලට ද එම සහන ඉහත චක්‍රලේඛයන් හි සඳහන් විධිවිධානවලට යටත්ව ලබාදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව එම බදු සහන ග්‍රාමීය ප්‍රදේශවලට ද අදාල කරගැනීමට කටයුතු කරන්න. මාගේ 2015/1, 2015/1(1), 2015/1 (11) චක්‍රලේඛ හා එම චක්‍රලේඛ ඒකාබද්ධ කරමින් නිකුත් කළ 2020/5 චක්‍රලේඛය අදාල පරිදි සංශෝධනය වූවා සේ සලකන්න. එම චක්‍රලේඛයෙහි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

**5. දත්ත පද්ධතියක් සකස්කර පවත්වාගෙන යාම.**

මෙම චක්‍රලේඛයේ සඳහන් සියලුම බදු සහන ලබාදීම් ආරම්භයේ සිටම විධිමත්ව ලේඛනගත කරමින් පරිගණක දත්ත පද්ධතියක් සකස්කර පවත්වාගෙන යා යුතුය. ඒ සඳහා "2020/06 චක්‍රලේඛයේ බදු සහන" නමින් MS Excel ගොනුවක් ආරම්භ කරන්න. එම MS Excel ගොනුවේ පහත පරිදි දත්ත පද්ධතිය සකස් කර යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමට කටයුතු කරන්න.

1. Sheet 01 - "කාර්තුමය බදු ගෙවීම" ලෙස නම් කර පහත තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරන්න.

| දී.කා.බ. අංකය | බදුකරුගේ නම | අරමුණ | බද්ද ආරම්භ වන දිනය | කාර්තුමය පදනමින් බදු ගෙවිය යුතු දිනය | | | | ගෙවිය යුතු බදු මුදල | බදු ගෙවීම (ඇත/ නැත) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1 | 2 | 3 | 4 | | |
| | | | | | | | | | |

2. Sheet 02 - "දිරිගැන්වීමේ වට්ටම" ලෙස නම් කර පහත තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරන්න.

| දී.කා.බ. අංකය | බදුකරුගේ නම | අරමුණ | බදු ගෙවිය යුතු දිනය | වාර්ෂික බදු මුදල | බදු ගෙවූ දිනය | 10%ක වට්ටම් මුදල | අය කළ බදු මුදල |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

3. Sheet 03 - "හිඟ බදු අය කිරීම" ලෙස නම් කර පහත තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරන්න.

| දී.කා.බ. අංකය | බදුකරුගේ නම | අරමුණ | වාර්ෂික බදු මුදල | හිඟ බදු වාරික ගණන | හිඟ බදු මුදල | අය කළ යුතු 10% අඩු පොලී ප්‍රමාණය | අය කළ යුතු මුළු බදු මුදල (පොලිය සහිතව) | කපා හළ පොලී මුදල | අය කළ යුතු හිඟ වාරික මුදල | හිඟ බදු මුදල් ගෙවීමට එකඟ වූ සහන කාලය | වාරික ප්‍රමාණය | වාරිකයක මුදල | බදු ගෙවීම පිළිබඳ සටහන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |

4. Sheet 04 - "ප්‍රතිශෝධන සහනය" ලෙස නම් කර පහත තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරන්න.

| දී.කා.බ. අංකය | නම | බදු අරමුණ (නේවාසික/ වාණිජ/ කෘෂිකාර්මික) | බද්ද ආරම්භ වන දිනය | අවසාන ප්‍රතිශෝධන දිනය | අවසන් බදු ප්‍රතිශතයට පෙර අය කළ බදු මුදල | 2020. . දිනට අය කළ යුතු බදු මුදල (අවසන් බදු ප්‍රතිශතයට පෙර අය කළ බදු මුදලින් 20%ක්) | ඊළඟ ප්‍රතිශෝධන දිනය (අවසාන ප්‍රතිශෝධන දිනයේ සිට වසර 5ක්) | ඊළඟ ප්‍රතිශෝධනයේ අය කළ යුතු මුදල (7හි මුදලට 20%ක් එකතු කර) | බදු ගෙවීම පිළිබඳ සටහන් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

ඒ අනුව යාවත්කාලීන කර පවත්වා ගන්නා MS Excel ලිපිගොනුවේ මෘදු පිටපතක් පළාත් ඉඩම් කොමසාරිස් හා (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්ට පිටපතක් සහිතව සෑම කාර්තුවකම අවසානයේ මා වෙත එවිය යුතු වේ. එක් එක් කාර්තුව ආරම්භ වන මුල් සතිය තුළ ඊට පෙර කාර්තුවට අදාළ තොරතුරු පහත දැක්වෙන දිස්ත්‍රික්කයට අදාළ විද්‍යුත් තැපැල් ලිපිනයට පිටපතක් සහිතව landfin85@gmail.com ලිපිනයට විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් එවිය යුතුය.

| දිස්ත්‍රික්කය | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|
| හම්බන්තොට, ගාල්ල, මාතර, ගම්පහ, ත්‍රිකුණාමලය, අම්පාර, මොණරාගල, බදුල්ල | lcgdland1@gmail.com |
| කොළඹ, කළුතර, මඩකලපුව, යාපනය, වව්නියාව, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම, රත්නපුරය, කෑගල්ල | lcgdland2@gmail.com |
| පොළොන්නරුව, අනුරාධපුරය, පුත්තලම, කුරුණෑගල, නුවරඑළිය, මහනුවර, මාතලේ | lcgdland3@gmail.com |

මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේදී යම් ගැටළුවක් වේ නම් මා විමසන්න.

ආර්.එම්.සී.එම්. හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය
3. ලේකම්, මුදල් අමාත්‍යාංශය
4. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
5. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
6. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
7. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
8. ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව
9. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

} - කරු. දැ.ගැ.ස.

ඇමුණුම 01

## කාර්තුමය පදනමින් බදු ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම

1. බදුකරුගේ නම : ..............................................................................................
2. දීර්ඝකාලීන බදු අංකය : ..............................................................................................
3. බදු වර්ගය (නේවාසික/ කෘෂිකාර්මික/ වාණිජ) : ..............................................................................
4. බදු ගෙවිය යුතු දිනය : ..............................................................................................
5. වාර්ෂික බදු මුදල : ..............................................................................................
6. කාර්තුමය පදනමින් ගෙවිය යුතු දිනය : -
   (i) පළමු කාර්තුව : ..............................................................................................
   (ii) දෙවන කාර්තුව : ..............................................................................................
   (iii) තුන්වන කාර්තුව : ..............................................................................................
   (iv) හතරවන කාර්තුව : ..............................................................................................
7. කාර්තුමය බදු මුදල : ..............................................................................................

(වාර්ෂික බදු මුදලෙන් හතරෙන් පංගුවකි.)

ඒ අනුව ................................... දිනට පෙර ............................ වර්ෂයට අදාල .......................... කාර්තුමය බදු මුදලවන ............................................... මුදලක් ගෙවන ලෙස මෙමගින් දැනුම් දෙනු ලැබේ.

..................................

ප්‍රාදේශීය ලේකම්

අත්සන සහ නිල මුද්‍රාව

ඇමුණුම 02

## <u>දිරිගැන්වීමේ වට්ටම පිළිබඳ බදුකරුවන් දැනුවත් කිරීමේ ආකෘතිය</u>

(බදුකරුගේ නම)

(ලිපිනය)

(බදුකර අංකය)

### <u>දීර්ඝකාලීන බදු ගෙවීමේදී දිරිගැන්වීම් වට්ටමක් ලබාදීම</u>

ඉහත නම සඳහන් ඔබ විසින් භුක්තිවිඳින රජයේ ඉඩම සඳහා ලබා දී ඇති .......................... අංක දරණ නේවාසික/ කෘෂිකාර්මික/ වාණිජ බදු ඉඩම හා බැඳේ.

අඛණ්ඩව නිසි පරිදි වාර්ෂික බදු මුදල් ගෙවන ඔබ විසින් ගෙවිය යුතු වාර්ෂික බදු මුදල සඳහා දිරිගැන්වීම් වට්ටමක් ලබාදීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2020/06 චක්‍රලේඛය පරිදි හැකියාව පවතින බව සතුටින් දන්වා සිටිමි.

එම දිරිගැන්වීම් වට්ටම ලබාගැනීම සඳහා ඔබ විසින් ගෙවිය යුතු වාර්ෂික බදු මුදල සෑම වසරකම ............................ දිනට පෙර හෝ එම දින සිට මසක් ඇතුළත ගෙවීමට කටයුතු කරන ලෙස මෙයින් ඔබට කාරුණිකව දන්වා සිටිමි.

.....................................

ප්‍රාදේශීය ලේකම්

අත්සන සහ නිල මුද්‍රාව

ඇමුණුම 03

**<u>හිඟ බදු මත අය කරන දඩ පොළිය සඳහා සහන ලබාදීම</u>**

1. බදුකරුගේ නම : ..............................................................................
2. දීර්ඝකාලීන බදු අංකය : ..............................................................................
3. බදු වර්ගය (නේවාසික/ කෘෂිකාර්මික/ වාණිජ) : ..............................................................
4. බදු ගෙවිය යුතු දිනය : ..............................................................................
5. වාර්ෂික බදු මුදල : ..............................................................................
6. 2019.12.31 දිනට හිඟ වාරික ගණන : ..............................................................................
7. ගෙවිය යුතු හිඟ බදු මුදල : ..............................................................................
8. ගෙවිය යුතු දඩ පොළිය : ..............................................................................

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2020/06 චක්‍රලේඛයේ 2.1හි උපදෙස් අනුව ඔබගේ හිඟ බදු මුදල මත අය කළ යුතු දඩ පොළිය වන රු. ................................ ක මුදල අය නොකිරීමට තීරණය කර ඇති බව සතුටින් දන්වමි.

ඒ අනුව ඔබ විසින් 2020................... දිනට ගෙවිය යුතු බදු මුදල රු. .............................. කි.

ඔබ විසින් ගෙවිය යුතු එම බදු මුදල ගෙවීම සඳහා වර්ෂයක සහන කාලයක් ලබාදීමට හැකියාව පවතින බැවින් එම සහනය ලබා ගැනීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද ඔබගේ ඉල්ලීම මා වෙත එවන ලෙස මෙමගින් දැනුම් දෙමි.

....................................

ප්‍රාදේශීය ලේකම්

අත්සන සහ නිල මුද්‍රාව

ඇමුණුම 04

## හිඟ බදු ගෙවීම සඳහා සහන කාලයක් ලබා ගැනීමට ඉල්ලීම

**ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්**

1. බදුකරුගේ නම : ..........................................
2. දීර්ඝකාලීන බදු අංකය : ..........................................
3. බදු වර්ගය (නේවාසික/ කෘෂිකාර්මික/ වාණිජ) : ..........................................
4. බදු ගෙවිය යුතු දිනය : ..........................................
5. වාර්ෂික බදු මුදල : ..........................................
6. 2019.12.31 දිනට හිඟ බදු මුදල : ..........................................
7. හිඟ බදු මුදල ගෙවීමට අපේක්ෂිත සහන කාලය (උපරිම වසරකි)
   ආරම්භ වන දිනය : ..........................................
   අවසන් වන දිනය : ..........................................
8. හිඟ බදු මුදල ගෙවීමට අපේක්ෂිත වාරික ගණන : ..........................................
9. වාරික වශයෙන් ගෙවීමට අපේක්ෂිත මුදල : පළමු වාරිකය - ..........................................
   දෙවන වාරිකය - ..........................................
   තෙවන වාරිකය - ..........................................
   සිවුවන වාරිකය - ..........................................

ඉහත පරිදි මාගේ හිඟ බදු මුදල ගෙවීමට සහන කාලයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි. ඉන් අනතුරුව වාර්ෂික බදු මුදල නියමිත පරිදි ගෙවීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි.

බදුකරුගේ නම : ..........................................

අත්සන : ..........................................

**ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය**

ඉහත බදුකරුගේ හිඟ බදු මුදල වන රු. ............................ක මුදල රු. ............................ වූ වාරික ..................න් වසරක් තුළ, එනම් ........................... දින සිට ........................ දින දක්වා කාලය තුළ අයකර ගැනීම ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2020/06 දිනැති චක්‍රලේඛයට අනුව අනුමත කරමි/ නොකරමි.

..........................................

ප්‍රාදේශීය ලේකම්

ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම්

කොමසාරිස් (අන්තර් පළාත්)

අත්සන සහ නිල මුද්‍රාව

# හිඟ බදු ගෙවීම සඳහා සහන කාලයක් ලබා ගැනීමට ඉල්ලීම

**ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්**

1. බදුකරුගේ නම : ..................................................................................................
2. දීර්ඝකාලීන බදු අංකය : ..................................................................................................
3. බදු වර්ගය (නේවාසික/ කෘෂිකාර්මික/ වාණිජ) : ..................................................................................
4. බදු ගෙවිය යුතු දිනය : ..................................................................................................
5. වාර්ෂික බදු මුදල : ..................................................................................................
6. මේ දක්වා හිඟ බදු මුදල : ..................................................................................................
7. හිඟ බදු මුදල ගෙවීමට අපේක්ෂිත සහන කාලය
   ආරම්භ වන දිනය : ..................................................................................................
   අවසන් වන දිනය : ..................................................................................................
8. හිඟ බදු මුදල ගෙවීමට අපේක්ෂිත වාරික ගණන : ..................................................................................
9. වාරික වශයෙන් ගෙවීමට අපේක්ෂිත මුදල : පළමු වාරිකය - ..........................................................
   දෙවන වාරිකය - ..........................................................
   තෙවන වාරිකය - ..........................................................
   සිවුවන වාරිකය - ..........................................................

ඉහත පරිදි මාගේ හිඟ බදු මුදල ගෙවීමට සහන කාලයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි. ඉන් අනතුරුව වාර්ෂික බදු මුදල නියමිත පරිදි ගෙවීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි.

බදුකරුගේ නම : ..........................................................

අත්සන : ..........................................................

---

**ඉඩම් කොමසාරිස් ජනරාල්**

දීර්ඝකාලීන බදු අංක ................................ දරණ බදුකරුගේ හිඟ බදු මුදල වන රු. ............................ මුදල, රු. ..........................ක වාරික ...................න් වසර .................. තුළ ගෙවීමට අනුමැතිය ලබාදීම නිර්දේශ කරමි/ නොකරමි.

..........................................................

ප්‍රාදේශීය ලේකම්
ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම්
කොමසාරිස් (අන්තර් පළාත්)
අත්සන සහ නිල මුද්‍රාව

---

**ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්**

හිඟ බදු මුදල වන රු. ................................ක මුදල රු. .................................. බැගින් වූ වාරික .........න් අයකර ගැනීම අනුමත කරමි/ නොකරමි. ඒ අනුව පළමු වාරිකය ගෙවීමෙන් පසු දීර්ඝකාලීන බදුකරය සැකසීම සඳහා පිඹුරුපත්වල පිටපතක් හා බදු ලෙජරයේ පිටපතක් මා වෙත එවන්න.

..........................................................

ඉඩම් කොමසාරිස් ජනරාල්
අත්සන සහ නිල මුද්‍රාව

ඇමුණුම 06

**.............................................. අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි**

**ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ............. චක්‍රලේඛය අනුව**

**වාණිජ/ කෘෂිකාර්මික දීර්ඝකාලීන බදු සඳහා සහන ලබාදීම**

1. බදුකරුගේ නම : ................................................................................................
2. දීර්ඝකාලීන බදු අංකය : ................................................................................................
3. බදු වර්ගය (නේවාසික/ කෘෂිකාර්මික/ වාණිජ) : ................................................................
4. බදු ගෙවිය යුතු දිනය : ................................................................................................
5. වර්තමාන වාර්ෂික බදු මුදල : ................................................................................................
6. අවසාන වරට බදු ප්‍රතිශෝධනය කළ දිනය : ................................................................
7. අවසන් බදු ප්‍රතිශෝධනයට පෙර අය කරන ලද වාර්ෂික බදු මුදල : ..........................................
8. 2020......................... (බදු අය කළ යුතු දිනය) දිනට අය කළ යුතු බදු මුදල : ..........................................

   (ඉහත අංක 7 හි සඳහන් මුදලට 20%ක් එකතු කර ලබා ගන්නා අගය වේ.)
9. ඊළඟ බදු ප්‍රතිශෝධන දිනය : ................................................................................................

   (ඉහත අංක 6 හි සඳහන් දිනයේ සිට වසර පහකි.)
10. ඊළඟ බදු ප්‍රතිශෝධනයේ දී අය කළ යුතු බදු මුදල : ................................................................

    (ඉහත අංක 8 හි සඳහන් මුදලට 20%ක් එකතු කර ලබා ගන්නා අගය වේ.)

ඒ අනුව ඉහත පරිදි බදු මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

..................................................

ප්‍රාදේශීය ලේකම්

ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම්

කොමසාරිස් (අන්තර් පළාත්)

අත්සන සහ නිල මුද්‍රාව

ඇමුණුම 07

දීර්ඝකාලීන බදු අංකය - .......................................

## රජයේ ඉඩම් ආඥා පනතේ 20 වන වගන්තිය යටතේ පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයට බදු මුදල සංශෝධනය කිරීම

## මෙම පැවරීමේ නීත්‍යානුකූල ලේඛනයේ 1 (ආ) යටතේ වන බදු ප්‍රතිශෝධනය අමප/20/0374/228/005 හා 2020.02.27 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි සංශෝධනය කිරීම

4/10/........................ දීර්ඝකාලීන බදුකරයෙහි 1 (ආ) උපලේඛනයෙහි දැක්වෙන,

"එසේකුදු වුවත් පසුගිය වසර පහේ කාල සීමාව වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ බදු මුදල 50%කට අඩුවන මුදලින් කිසියම් කාල සීමාවක් වෙනුවෙන් ගෙවිය යුතු බදු මුදල ලෙස දීමනාකරු විසින් නියම නොකළ යුතුය." යන වගන්තිය

"එසේ නියම කරනු ලැබූ බදු මුදල පසුගිය වසර පහේ කාල සීමාව වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ බදු මුදලට 20%ක ප්‍රතිශතයක් එකතු කිරීමෙන් ගණනය කරන බදු මුදල ලෙස දීමනාකරු විසින් නියම නොකළ යුතුය." ලෙස සංශෝධනය කිරීම.

| | |
|---|---|
| ............................................. | ............................................. |
| ඉඩම් කොමසාරිස් ජනරාල් | බදු ලැබුම්කරු |
| දිනය : .............................. | දිනය : ................................ |